**ශීර්ෂය 327- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී කාර්ය මණ්ඩල පුහුණු වැය විෂය යටතේ ප්‍රතිපාදිත රු. 2,000,000 කින් වැයකළ මුදල රු.695,128 ක් වූ අතර ඉතිරිය රු.1,304,873 ක් විය. එම ඉතිරිය සියයට 65 ක් වූ අතර එය මුදල් රෙගුලාසි අංක 04 හි සඳහන් නියමයන්ට පටහැනි විය. | භාණ්ඩාගාර ලේකම්ගේ අංක BD/CBP/01/01/05/2022 හා 2023-01-27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 මගින් කාර්යමණ්ඩල පුහුණු සඳහා වන වියදම් යටතේ අනිවාර්ය දේශීය පුහුණුවීම සඳහා පමණක් පුහුණු අවස්ථා ලබා දෙන ලෙස කළ දැනුම් දීම මත, ආයතනය සැලසුම් කරන ලද පුහුණු අවස්ථාවන් පැවැත්වීම සීමා වීම හේතුවෙන් මෙම ඉතිරිවීම සිදුවී ඇත. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත හා තිරසාර ලෙස කළමනාකරණය කිරීම සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනයට 2018 අගෝස්තු මාසයේදී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ප්‍රධාන කාර්යයක් වන ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සකස්කිරීම සහ කාලීන අවශ්‍යතාවයන් අනුව එය සංශෝධනය කිරීමට සකස් කළ අවසන් කෙටුම්පත ඉඩම් හා සංචාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සැකසීමේදී ඊට අදාළ කාර්යභාරය ප්‍රධාන කාර්ය කොටස් 2ක් යටතේ සිදුවන අතර, එම කාර්යය කොටස් ඉඩම් අමාත්‍යාංශය හා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු වනු ඇත. ප්‍රතිපත්ති සංශෝධන ප්‍රකාශනය අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා2023 මැයි 11 දින ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇතත් දෙපාර්තමේන්තුවට මැදිහත් විය නොහැකි ප්‍රතිපත්තිමය කාරණාවක් මත ඉඩම් අමාත්‍යාංශය විසින් අවසන් කරන ලද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සිදුකර නොමැති අතර, එය මෙම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වූ කරුණකි. | ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු කඩිනමින් අවසන් කරගත යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 323 ක ඉඩම් පරිහරණ සැලසුම් යාවත්කාලීන කරනු ලබන බව සඳහන් වුවද කාර්ය සාධන වාර්තාවට අනුව එම සංඛ්‍යාව 260 ක් විය. | ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම පියවර කීපයක් යටතේ සිදුකර අවසන් සැලැස්ම 2023 වර්ෂය අවසන් වීමට පෙර ප්‍රධාන කාර්යාලයට මුද්‍රිත හෝ මෘදු පිටපත් (soft copy) ලෙස බාර දෙන ලෙස සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප.)වරුන් වෙත දන්වා තිබිණ. මෙම සැලසුම් 323 ම සැකසීමේ කටයුතු එකවර ආරම්භ කරන ලද අතර, 2023 දෙසැම්බර් මස අවසන් වන විට එයින් අවසන් සැලසුම් වාර්තා 260ක් ප්‍රධාන කාර්යාලයට ලැබී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 24 දින දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කළද 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2022 වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඇතත් ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අනුමැතිය නොලබා ගණන් දීමේ නිලධාරියා පමණක් අනුමත කර තිබුණි. | ඉදිරි වසරේ සිට නිවැරදිව ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛය පරිදි ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අවම වශයෙන් වසර 03 ක කාලයකට අපේක්ෂිත ප්‍රසම්පාදනයන් එම සැළැස්මෙහි ලැයිස්තු ගතකර තිබිය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එම මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සම්පාදනය කර නොතිබුණි. | ඉදිරි වසරේ සිට නිවැරදිව ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් පිළපැදිය යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව දෙපාර්තමේන්තුව සඳහා එහි ගණන් දීමේ නිලධාරියා විසින් 2022 පෙබරවාරි 01 දින සිට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙකු පත් කරන ලෙස ඉල්ලීම් කර පත් කර නොමැති බැවින්, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ විගණන අංශය මඟින් එම කටයුතු කරන ලෙස මගේ අංක LUPPD/1/2/-I වෙළුම හා 2023 ඔක්තෝබර් 18 දිනැති ලිපිය මඟින් කරන ලද ඉල්ලීම අනුව එම කටයුතු සිදු කරනු ලබයි. | දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 697 ක් වන නමුත්, තථ්‍ය සංඛ්‍යාව 620 ක් වූ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 21 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 1 ක්, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 36 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 19 ක් සමඟ මුළු පුරප්පාඩු 77 ක් පැවතිණි. | ශ්‍රී.ලං.ප.සේ. අනුමත තනතුරු 4 න් එක් තනතුරක් යටපත් කිරීමටත්, තවත් තනතුරක් යටපත් කර නීති නිලධාරී තනතුරක් ඇති කිරීමට නිර්දේශ යවා ඇත. එක් දිස්ත්‍රික් කාර්යාලයකට එක් තනතුර බැගින් සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) තනතුරු 25ක් අනුමත කර ඇති අතර, මේ වන විට තනතුරු 06ක් බඳවාගෙන ඇත. පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතියට යවා ඇත. එසේම දෙපාර්තමේන්තුගත සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා සීමිත හා විවෘත තරග විභාග පවත්වා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතී. | කාර්ය සාධන දර්ශක පදනම්ව අනුමත සේවක සංඛ්‍යාවන් පිළිබඳව නැවත සමාලෝචනයක් සිදු කළ යුතු වේ. |